**e - ඥාන පියස වැඩසටහන**
**දියමන්ති ව්‍යාපෘතිය**
**සමානාය පාඩම් - 3 පාඩම**

| විෂය | ශ්‍රේණිය | වාරය | පාඩම/ඒකකය |
|---|---|---|---|
| චිත්‍ර කලාව | 10 | III | 6.1.4. ඩේවිඩ් පේන්ටර් ශිල්පියාගේ නිර්මාණ අගයමු |

## ඩේවිඩ් පේන්ටර්

- වර්ෂ 1900 දී උතුරු ඉන්දියාවේ ඇල්මෝරා හි දී උපත ලැබූ ඔහු එංගලන්තයේ රෝයල් ඇකඩමියේ චිත්‍ර කලාව පිළිබඳ අධ්‍යාපනය ලබා ඇත.
- යුරෝපීය ශාස්ත්‍රාලීය චිත්‍ර කලාවේ ස්වභාවිකවාදී චිත්‍ර කලා ආභාසය සහිතව ඔහුටම ආවේණික චිත්‍ර ශෛලියක් නිර්මාණය කරගෙන ඇති අතර ලංකා කලා සංගමයට අයත් අද්‍යතන යුගයේ චිත්‍ර ශිල්පියකු වේ.
- ප්‍රතිරූප, භූමි දර්ශන, මානව රූප සම්පිණ්ඩන, ත්‍රිත්ව දෙව්මැදුරේ බිතු සිතුවම් ඩේවිඩ් පේන්ටර්ගේ නිර්මාණ සඳහා වස්තු විෂය වූ තේමා වේ.
- ජීවගුණය හා කායික සුන්දරත්වය මැනැවින් පිළිබිඹුවන ලෙස මානව රූප චිත්‍රණය කිරීම, චිත්‍රයේ ගැඹුර හා පර්යාලෝක ලක්ෂණ නිරූපණය, ත්‍රිමාන ලක්ෂණ සහිතව දීප්තිමත් වර්ණමාලාවක් භාවිත කිරීම ඔහුගේ සිතුවම්වල ලක්ෂණ වේ.
- ඔහුගේ සිතුවම් ලෙස **යහපත් සමරිතානුවරයා** හා **ජයග්‍රාහි ලෙස ජෙරුසෙලමට ඇතුළු වීම** ගතහැක.

**<u>ක්‍රියාකාරකම</u>**

1) ඩේවිඩ් පේන්ටර් ශිල්පියා පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

2) ඩේවිඩ් පේන්ටර්ගේ නිර්මාණවල සුවිශේෂී ලක්ෂණ නම් කරන්න.

3) පහත දී ඇති සිතුවම හඳුනාගනිමින් කෙටි හැඳින්වීමක් කරන්න

•හඳුනාගත් බව : ……………………………
•ශිල්පියා : ……………………………
•ශිල්ප ක්‍රමය : ……………………
•වර්ණ භාවිතය : ……………………
•ශිල්පීය කුසලතා: …………………



**<u>ඇගයීම</u>**

1) ඩේවිඩ් පේන්ටර් ශිල්පියාගේ නිර්මාණ, තොරතුරු හා ඡායාරූප එක්රැස් කරන්න

2) ඔහුගේ ප්‍රසිද්ධ නිර්මාණ හා ඒවා හමුවන ස්ථාන නම් කරන්න.

3) ඔහුගේ නිර්මාණ සඳහා බලපෑ කලා ආභාසය පිළිබඳ විස්තර කරන්න

4) ඩේවිඩ් පේන්ටර් ශිල්පියාගේ ප්‍රධාන සිතුවම් 3ක් ගෙන හඳුනාගත් බව, ශිල්ප ක්‍රමය, වර්ණ භාවිතය හා ශිල්පීය කුසලතා යන උප මාතෘකා ඔස්සේ කෙටි හැඳින්වීමක් කරන්න